# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,949 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 62 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 69 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

59- B 81019—5,402 (2016/01)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මන්නාරම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 පෙබරවාරි මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 දෙසැම්බර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මන්නාරම නගරය | එරික්කලම්පිට්ටි කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |

01-278

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

### නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සංඛ්‍යාව - 01

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනයට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලටද යටත් විය යුතුය.

(v) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.

04. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි SL - I - 2006 වැටුප් කාණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා පහත සඳහන් ලකුණු දීමේ පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | 20 |
| පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| **සටහන.**-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත්වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි. | | |
| (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | 15 |
| පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍ර පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. **අතිරේක පළපුරුද්ද :** | | 30 |
| නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 | | |
| එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර) | | |
| (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| 04. **පරිගණක සාක්‍ෂරතාව :** | | 15 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්‍ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු හෝ පැය 1500කට නොඅඩු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| - මාස 06/පැය 720 | 07 | |
| - මාස 03/පැය 360 | 05 | |
| 05. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :** | | 15 |
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය) | 15 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| - මාස 06/පැය 720 | 07 | |
| - මාස 03/පැය 360 | 05 | |
| 06. **සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන ලද කුසලතාව :** | | 05 |
| **මුළු ලකුණු :** | | 100 |

07. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(අ) අයදුම්පත් 2016.02.08 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
සුහුරුපාය,
බත්තරමුල්ල.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 වන පිටුව අංක 07 සිට 10 දක්වාත් 03 වන පිටුව අංක 11 සිට 12.2 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා අයුදුම් කිරීම " යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම*

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

01. මුලකුරු සමඟ නම :————. (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

01.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :————.

වර්ෂය :————. මාසය :————. දිනය :————.

03.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ -M, ස්ත්‍රී - F) : ☐

05. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

06. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

07. *අධ්‍යාපන සුදුසුකම් :*

07.1 *අ. පො. ස. (උ. පෙ) විභාගය පිළිබඳ විස්තර :*

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07.2 *ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :*

(i) විශ්ව විද්‍යාලය :—————.
(ii) උපාධිය ලබාගත් වර්ෂය :—————.
(iii) ලබා ඇති උපාධිය :—————.

08. *පළපුරුද්ද :*

(i) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස කටයුතු කර ඇති කාලය :—————.

09. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? ඔව් / නැත

09.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :—————.

10. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………… නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ……… දින මා ඉදිරිපිට දී ඉහත 10 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

12.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ,
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්වී නැත/ඇත.

12.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

01-447

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරට බඳවා ගැනීම - 2015

මෙම අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරුවල පවතින පුරප්පාඩුවක් සඳහා සුදුස්සෙකු තෝරා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ ''විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය : 2016.02.08 වැනි දින වේ.

**සටහන.**—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාදෙන ලකුණු මත තෝරා ගනු ලබයි.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය,

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුලත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03ක් තුලදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය වසර පහක් (05) ඇතුලත ලබාගත යුතුය. 1 කාණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙක් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006, රු. 22935 - 10 x 645 - 8 x 790 - 17 x 1050- රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *සුදුසුකම් :*

(i) අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකුවීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

05. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපනු ඇත.)

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතුය.
(iii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය :*

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමය :

| *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :* | | |
| I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ උපාධියෙහි; | | |
| පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| දෙවන පන්තියේ ඉහල සාමාර්ථයක් සඳහා | 15 | |
| දෙවන පන්තියේ පහල සාමාර්ථයක් සඳහා | 10 | |
| II. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ සාමාර්ථය සඳහා | 15 | 20 |
| III. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ සාමාර්ථයක් සඳහා | 10 | |
| (ලකුණු ලබා දෙනු ලබන්නේ උපාධිය හෝ නීති විද්‍යාලයේ අවසන් වසරේ පරීක්‍ෂණය යන දෙකෙන් ලබා ඇති ඉහළම සුදුසුකමට පමණි). | | |
| 02. *අතිරේක වෘත්තීය සුදුසුකම් :* | | |
| I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM) | 15 | |
| II. පාඨමාලාවේ කාලසීමාව එක් වසරකට නොඅඩු වූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 08 | 15 |
| III. පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩු වූ පශ්චාත් නීති ඩිප්ලෝමාව | 05 | |
| 03. *පළපුරුද්ද :* | | |
| I. රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ නීතිඥවරයෙකු ලෙස ලබා ඇති පළපුරුද්ද. (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම වන අවුරුදු 03ක සේවා පළපුරුද්දට අමතරව නීතිඥයෙකු ලෙස ලබා ඇති පළපුරුද්ද මෙහිදී සලකා බලනු ලැබේ). | වසරකට ලකුණු 05 බැගින් | 30 |
| එක් වර්ෂයකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30කි. | | |
| (විනිසුරුවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| 04. *පරිගණක හැකියාව —* | | |
| I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්‍ෂණ විෂය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් වූ උපාධිය. | 15 | |
| II. මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | 10 | 15 |
| III. මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 05 | |

| විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|
| 05. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය — | | |
| I. උපාධිය, පශ්චාත් උපාධිය, නීතිවේදී පාඨමාලාව, පශ්චාත් නීති පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම. (අදල විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුයි.) | 15 | |
| II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව. (පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩුවූ) | 10 | 15 |
| III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පාඨමාලාවේ කාලසීමාව මාස 03කට නො අඩුවූ) | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | 05 |

10. (I) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළයුතු අතර, 1 සිට 14 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 15 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත්‍ර මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව සකසන්න. ඉල්ලුම්පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

*සැලකිය යුතුය* .— (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(II) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,

ආදර්ශ අයදුම්පත්‍රය

***රාජ්‍ය සේවා කොමිෂන් සභාව***

**අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා අයදුම්පත්‍රය**

අංකය :————.
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ :————. මාස :————. දින :————.

09. ජාතිය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. නීති උපාධිය පිළිබඳ විස්තර :

විශ්ව විද්‍යාලය :————.

උපාධිය පිරිනැමූ දිනය :————.

භාෂා මාධ්‍යය :————.

12. නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

13. නීතිඥයෙකු ලෙස වෘත්තීය පළපුරුද්ද : වසර ගණන :————.

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 09 ඡේදයට අනුව සුදුසුකම් :

(i) ......................................................
(ii) ......................................................
(iii) ......................................................
(iv) ......................................................
(v) ......................................................
(vi) ......................................................
(vii) ......................................................
(viii) ......................................................

15. භාෂා ප්‍රවීණතාව (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න.)

| | *ඉතා හොඳයි* | *හොඳයි* | *සාමාන්‍යයයි* | *දුර්වලයි* |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

**අයදුම්කරුගේ සහතිකය**

........................................... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

........................................... මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ........................ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

01-444

---

**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය**

ලේකම් හා ගණකාධිකාරී තනතුර

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය නිලධාරීන්ගෙන් (ස්ත්‍රී/පුරුෂ) අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ හෝ I පන්තියේ නිලධාරියෙකු විය යුතුය.

(ii) කොළඹට සැතපුම් 30ක් ඇතුළත ස්ථිරව පදිංචිව සිටිය යුතුය.

(iii) 2016.01.01 දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය.

(iv) රාජ්‍ය සේවයේ අවුරුදු 15කට නොඅඩු සේවාවක් තිබිය යුතුය.

(v) ඉල්ලුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් වැඩකිරීමේ හැකියාව තිබිය යුතුය.

(vi) ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳවත්, පරිගණක දැනුම හා පළපුරුද්ද ඇති සංගමයේ සාමාජිකත්වය දරන අය කෙරෙහි හා දෙමළ භාෂාව ගැන දැනුමක් ඇති අය කෙරෙහිත් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තනතුරට අදාළ වැටුප.—තෝරාගත් අයදුම්කරුට රාජ්‍ය සේවයේ දී ලැබූ වැටුප හා දීමනාද ඊට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 50%ක අතිරේක දීමනාවක්ද ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 02ක (දෙකක) කාලයක් සංගමයේ සේවය සඳහා ද්විතියනය පදනම මත බඳවාගනු ලැබේ. ඔහු විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඇප ඔප්පුවක් මගින් රු. 50,000 ක රක්ෂණ ඇපයක් තැබිය යුතුය.

සියලු විස්තර සහිත අයදුම්පත් තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා මගින් 2016.01.25 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

නිහාල් ප්‍රැන්සිස්කු,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

01-427

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2016/2017**

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතුය) අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

1.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය / අංක ගණිතය ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනක දි විෂයන් 06 කින් සම්මාන 03ක් සහිතව සමත් විය යුතු ය.

තව ද, ඔහු හෝ ඇය,

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම;

*හෝ*

(ආ) ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබීම;

*හෝ*

(ඇ) ජාතික පාසැල් ක්‍රීඩා තරගාවලියේ වයස 16 න් ඉහළ තරගයක ප්‍රථම ස්ථානය ලබා තිබීම;

*හෝ*

(ඈ) ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් දකුණු ආසියාතික තරග, ආසියාතික ශූරතා තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය, ලෝක කුසලාන, හෝ ඔලිම්පික් තරගයකට සහභාගි වී තිබීම;

*හෝ*

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයක හෝ පළාත් සභාවක ක්‍රීඩා නිලධාරියකු හෝ නිලධාරිනියක වශයෙන් සේවය කිරීම හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක වශයෙන් සේවය කිරීම. (සටහන 01 ට අදාළ අවශ්‍යතාවයන් සපුරා තිබීම අනිවාර්ය වේ);

*හෝ*

(ඊ) රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයකු, ගුරුවරියක් වීම, පුහුණුකරුවකු හෝ පුහුණුකාරිණියක වීම (ස්වේච්ඡා සේවය සලකා බැලේ) පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක වීම, තරුණ සේවා සභාවේ ක්‍රීඩා නිලධාරියෙකු හෝ නිලධාරිණියක වීම;

සහ

වසර 05 ක සේවා පළපුරුද්දක් සහිතව ජාතික ක්‍රීඩා සංගමයකින් ලබාගත් ක්‍රීඩා පුහුණු කිරීමේ අදියර බලපත්‍රයක් ලබා තිබීම.

*හෝ*

(උ) ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු උපදේශකවරයෙකු/වරියක වශයෙන් මාස 06කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදරා සමත්වී තිබීම.

සැ.යු. - සටහන

01. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වුවන් වසර 01ක සේවා කාලයක් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු වූවන් වසර 05ක (විද්‍යාපීඨ අභ්‍යාසලාභී ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා පමණක් වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

02. නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *අයදුම්පත් එවීමේ ක්‍රමය* :

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8'' x 13 1/2'' ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2016 පෙබරවාරි මස 08 වැනි දිනට හෝ ඊට පෙර ''අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

2.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "2016/2017 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.4 විභාග ගාස්තු වශයෙන් රු. 500.00 ක මුදල් ඇණවුමක් ලේකම් ක්‍රීඩා අමාත්‍යාංශය නමට කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි වන පරිදි එවිය යුතු අතර, කුවිතාන්සිය අයදුම්පත සමග එවිය යුතු ය.

3. *තෝරා ගැනීම* :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික

යෝග්‍යතා ප්‍රායෝගික පරීක්‍ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. *පාඨමාලාව පිළිබඳ විස්තර*:

4.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් සමන්විත වේ. :-

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත - ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්‍ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්‍ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්‍ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, අයදුම්කරුවන් විසින් රු. 30,000 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලා ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්‍ෂකයන් පමණි. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් "ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය" යනුවෙන් සටහන් කළ යුතු ය. මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා "ක්‍රීඩා ඩිප්ලෝමා" සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. අනෙකුත් කොන්දේසි :

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එතෙකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතු ය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම් පතෙහි සඳහන් කළ යුතු අතර, සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්‍ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2016 ජනවාරි මස 08 වැනි දින.
100/7 නිදහස් මාවත,
කොළඹ 07,

ආදර්ශ අයදුම් පත්‍රය

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2016/2017

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

01. (i) සම්පූර්ණ නම :————. /මයා/මිය/මෙනවිය.

(ii) මුලකුරු සමඟ නම :————.

(iii) සම්පූර්ණ නම :

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

(ඉංග්‍රීසි භාෂාවෙන් කැපිටල් අකුරෙන්)

(iv) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. ලිපිනය (i) පෞද්ගලික :————.

(ii) රාජකාරී :————.
දුරකථන අංකය (පෞද්ගලික) :————. දුරකථන අංකය (රාජකාරී) :————.

03. (i) උපන්දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(ii) 2015.12.31 දිනට වයස : අවුරුදු | | | මාස | | | දින | | |

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැතිද? යන වග :————.

පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන්ද? පරම්පරාවෙන් ද ? යන වග :————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ii) විවාහක/අවිවාහක බව :————.

06. ඔබ රැකියාවක් කරයි ද? / නොකරයි ද? යන වග :
(i) තනතුර :————.
(ii) සේවා කාලය :————.
(iii) සේවා ස්ථානය :————.

07. (i) අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය :

වර්ෂය | | | | |

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථයන්* | *විෂය* | *සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය :

වර්ෂය : | | | | |

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

(iii) වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උසස් විභාග/උපාධි) :

වර්ෂය : | | | | |

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න. (සියලුම සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවන්න.)

1. ජාතික පාසල් වයස අවුරුදු 16 ඉහළ දක්ෂතා :————.

2. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්ෂතා දිස්ත්‍රික්/පළාත්/ජාතික :————.

3. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරඟවල දක්‍ෂතා :————.

4. ජාත්‍යන්තර තරග සහභාගිත්වය :————.

09. (i) *ගැසට් නිවේදනය 1.2 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ද යන්න දක්වන්න.*

| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

(ii) ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තර වී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර. :————.

10. වෙනත් කරුණු :————.

11. කුරුඳු වත්ත තැපැල් කාර්යාලය වෙත එවන ලද විභාග ගාස්තු වශයෙන් ගෙවූ රු. 500 ට අදාළ කුවිතාන්සි අංකය ............................ (ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය නමට එවිය යුතු අතර, කුවිතාන්සිය මෙයට අමුණා එවිය යුතු ය).

12. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 30,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, යන වග ඃ

.........................................................................

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

---

රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි

අධ්‍යක්‍ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම ............................. සේවය කරන ...................................... වන ..........................................මහතා/මහත්මිය/මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

———,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :———.

දිනය :———.

නම :———.

තනතුර :———.

01-402

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.